# අන්තවාද මධ්‍යස්ථවාද සහ ඒකීය රට

-----------------------------------------------------

අන්තවාදයක් යනු කුමක්ද? මධ්‍යස්ථ මතවාදයක් යනු කුමක්ද? දේශපාලන හෝ වෙනත් කරුණු සම්බන්ධයෙන් සිදුවන අදහස් දැක්වීම වලදී අන්තවාද සහ මධ්‍යස්ථමතවාද ගැන කියවෙනු දැකිය හැකිය . බොහෝ විට සිදුවන්නේ අන්තවාදයක් යනුවෙන් හංවඩු ගසා යම් මතවාදයක් හෙලාදැකීම හෝ ප්‍රතික්ෂේප කිරීමයි . ජාතික චින්තන ගුරුකුලයටද ඇතැමුන් විසින් අන්තවාදී චෝදනාව එල්ල කරනු අප දැක ඇත . යමක් අන්තවාදයක් වන්නේ කෙසේද යන්න පිළිබඳව හරි එකඟතාවක් නැතිවුවද අන්තවාදයක් යනු බැහැර කළයුතු මතවාදයක් යැයි හැඟීමක් සමාජයේ වෙයි. මා එය හැඟීමක් යයි කියන්නේ ඇතැම් දෙනා විරුද්ධ මත පහසුවෙන් හෙලාදැකීමට අන්තවාදී හංවඩුව ගැසුවද එවැනි හෙලාදැකීමක් සාධාරණීකරණය කෙරෙන වෙනත් හේතුවක් පෙනෙන්නට නැති බැවිනි. මෙහිදී සමාජය ලෙස හැඳින්වූයේ ලංකාවේ සමාජය බව කිවයුතුය. එයින්ද සිංහලෙන් පුවත්පත්, අන්තර්ජාල වෙබ් අඩවි සහ බ්ලොග් ආදියේ ලියන මධ්‍යස්ථවාදීහු අන්තවාදී නොවීමේ වැදගත්කම ගැන පවසති. අන්තවාද සහ මධ්‍යස්ථ(මත)වාද අතරින් එකක් බැහැර කිරීමත් අනෙක පිළිගැනීමටත් යුතුකමක් තිබේද ? මේ හැඟීම ඇතිවී ඇත්තේ ඇයි?

මා සිතන අයුරින් නම් මේ හැඟීමට මුල්වී ඇත්තේ බෞද්ධයන් අතර ඇති මධ්‍යම ප්‍රතිපදාව පිළිබඳ දැනුමයි . මධ්‍යම ප්‍රතිපදාව හෙවත් මැදුම් පිළිවෙත පිළිබඳව බොහෝ දෙනා සිතන්නේ විඳීමෙන් අන්තයට යාම එනම් අධික ලෙස සැප විඳීම හෝ අධික ලෙස දුක්විඳීම යන අන්ත දෙක වෙනුවට ඒ දෙක අතරමැද පිළිවෙතකට එළඹීමක් ලෙස ය.

නමුත් මැදුම් පිළිවෙත ගැන අපට මෙවැනි ප්‍රශ්නයක්ද නැගිය හැකිය . පංචේන්ද්‍රියන් පිනවීම හෝ තැවීම යන ක්‍රම නිවන් අවබෝධයට සහ බුද්ධත්වයට මග නොවේයැයි තේරුම්ගෙන සිදුහත් තවුසාණන් ඒ සියල්ල එනම් විවිධ විඳීම් පුහුණු කිරීමෙන් නිවන් දැකීමට උත්සහ දැරීමම අත්හැර දැමූවාද ? සාමාන්‍යයෙන් රාග සහ ද්වේශ යන අකුසල චේතනා හේතුවෙන් කෙරෙන දෑ ලෙස කාමසුඛල්ලිකානු යෝගයත් අත්ථකිලමතානු යෝගයත් හැඳින්විය හැකිය. රාග සහ ද්වේශ චේතනාවන්ගෙන් අන්තයට යාම වෙනුවට සම පමණින් තබාගෙන නිවන් අවබෝධ කළ හැකි නොවේ. නිවන් අවබෝධ කරන්නේ රාග ද්වේශ සහ මෝහ යන තුනම දුරු කිරීමෙනි . එසේ නම් එවැනි ක්‍රමයක් මැදුම් පිළිවෙත ලෙස හැඳින්වීම නොගැලපේ . මැදුම් පිළිවෙත යනු 'එයින් බාගයක් සහ මෙයින් බාගයක් ' ගැනීමේ ක්‍රමයක් නොව 'එයත් නොවන මෙයත් නොවන' ක්‍රමයක් විය යුතුය.

මැදුම් පිළිවෙත පිළිබඳ විග්‍රහය කෙසේ වුවත් මතවාද සම්බන්ධයෙන් මධ්‍යස්ථවාදයක් අනුගමනය කිරීම එමගින් සාධාරණීකරණය කළ හැකි නොවන බව පැහැදිලි කරුණකි . ඇතැම් අවස්ථාවල අපට ඇති තේරීම් ගණන දෙකකට සීමාවෙයි. එවිට ඉන් එකක් තෝරාගැනීම අන්තවාදයකැයි මධ්‍යස්ථවාදීන් කියන්නේද ? වාද දෙකක් අතරින් එකක් තෝරාගැනීමට ඇතිවිට ඊනියා මධ්‍යස්ථයක් සොයන්නේ කෙසේද ? සරල උදාහරණයක් නම් කාසියක් උඩ දැමීමයි. කාසිය බිම තැබිය හැකි ක්‍රම තුනක් වුවද එය බිම වැටීමේදී අගය හෝ සිරස වැටීමට ඇති හැකියාව ඉතා ඉහලය. දැන් කාසිය උඩ දැමූවිට අගය පැත්ත වැටෙනු ඇතැයි කියන තැනැත්තා අන්තවාදී අගයවාදියෙක් වන්නේද ? අන්තවාදී නොවී කෙලින් අතට සිටින තුරු කාසිය උඩදැමිය යුතුද?

ලංකාවේ විරුද්ධ මත හෙලාදැකීම සඳහා අන්තවාදී ලේබලය ඇලවීමට බලාසිටින ලේබල්කරුවෝ සිටිති . කලකට ඉහතදී ලේබල්කරුවෝ ඊනියා බලය බෙදීමට විරුද්ධ වුවන් අන්තවාදීන් ලෙස නම් කළහ . අද කොටි පරාජය වීම හේතුවෙන් පසුබා සිටියද ඔවුහු වෙනත් ක්‍රම වලින් බලය බෙදීමේ ක්‍රියාදාමය ඉදිරියට ගෙනයාමට උත්සහ දරති. අන්තවාදී නොවී දෙමළ ජනතාවට ඇතැයි කියවෙන ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමට බලය බෙදිය යුතුයැයි ඔවුහු කියති . බලය බෙදිය යුතුය යන්න මධ්‍යස්ථ මතයක්ද ? යම් මතයක් මධ්‍යස්ථවාදයක් ලෙස පෙන්වා දීමට නම් අඩුතරමින් වෙනත් මත දෙකක් අනෙක් අන්තවාදයන් ලෙස පෙන්වා දිය යුතු බව බොරු මධ්‍යස්ථවාදියෙකුට වුවද පිළිගැනීමට සිදුවෙයි . බලය බෙදිය යුතුය යන මතය සහ ඊලම ලබාදිය යුතුය යන මතය යන දෙක අතර වැඩි වෙනසක් නැත. මේ දෙකෙන්ම සිදුවන්නේ අවසානයේ රටේ ඒකීය බව නැතිකර දැමීමය. රටේ ඒකීය බව නැති කරන්නේද එය ආරක්ෂා කරගන්නේද යන ප්‍රශ්නය අපට වැදගත් ප්‍රශ්නයයි . මේ ප්‍රශ්නයේදී ඉහත වාද දෙකම අයත් වන්නේ එකම අන්තයකටය . එහිදී අපි "මධ්‍යස්ථ" නොවී ඒකීය රට රැකගැනීම වෙනුවෙන් පෙනීසිටිමු .

සාමාන්‍යයෙන් අන්තවාද ක්‍රියාත්මක කිරීමට අපහසු බවත් මධ්‍යස්ථ මතය ක්‍රියාත්මක කිරීමෙන් දෙපක්ෂයකට තම තමන්ගේ ආස්ථානයන් විශාල වශයෙන් වෙනස් නොකරගෙන එකඟ විය හැකි තත්වයක් නිර්මාණය වන්නේය යන්න තවත් තර්කයකි. එහෙත් මෙය සැමවිටම සිදුවන්නක් නොවේ. එවැනි තත්වයන් ඇතිවන්නේ දෙපාර්ශවයටම තම ස්ථාවරයන් සාධක සහිතව පෙන්වාදිය හැකි තත්වයක් ඇතිවිටදී ය . එවැනි තත්වයකදී දෙපාර්ශවය විසින්ම එසේ පෙන්වාදිය නොහැකි හෝ එකඟ විය නොහැකි කරුණු අතහැර යම් යම් කරුණු සම්බන්ධයෙන් එකඟවනවා විය හැකිය . උදාහරණයක් ලෙස බලය බෙදීමක් අවශ්‍ය කුමන ප්‍රශ්න විසඳීම සඳහාදැයි කරුණු සහිතව පෙන්වාදීමට ඒ වෙනුවෙන් පෙනීසිටින්නන්ට හැකි වියයුතුය . එසේ නොහැකිව ඔවුන් මධ්‍යස්ථ ගැන කතා කරන්නේ තමන්ගේ මතවාදයේ දුර්වලත්වය වසා ගැනීමටය . පසුගිය කාලයේ ප්‍රභාකරන් බටහිර රටවල ආධාරද ඇතිව යකා නැටුවේ සිංහලයන් මත බලහත්කාරයෙන් සංගත නොවන දෙමළ ජාතිවාදී මතය පැටවීම සඳහාය . සිංහලයන්ව පමණක් මධ්‍යස්ථ කිරීමද දෙමළ ජාතිවාදය බලෙන් පැටවීමට යොදාගැනුණු පුහු වාදයකි .

පසුගිය වසරේ හමුදා මෙහෙයුම් ජයග්‍රහණයකින් කෙළවර වූයේ ඒකීය රාජ්‍යය නැතිකර දැමීමේ ප්‍රභාකරන්ගේ මතවාදය පරාජය කිරීමෙන් බව අමතක නොකරමු. එහි මතවාද දෙකෙන් එකක් එනම් ඒකීය රාජ්‍යය රැකගත යුතුය යන මතය තීරණාත්මක ජයග්‍රහණයක් ලබාගැනීමක්ද වෙයි. මේ නිසා තුවක්කුවලට හෝ බෝම්බ වලට බියෙන් මධ්‍යස්ථ වියයුතු යැයි කීමට දැන් හේතුවක් නැත .

අපි මධ්‍යස්ථවාදීන් නොවන අතර යම් මතවාදයක සංගතභාවය වඩා වැදගත් සේ සලකමු . එනම් මතවාදයක් අන්තවාදී හෝ මධ්‍යස්ථවාදී හෝ වේවා එය සමස්තයක් ලෙස පරස්පර විරෝධී නොවන විශ්වසනීය කතාවක් ලෙස ගොඩනැගී ඇත්ද යන්න අපට වැදගත් වෙයි. මධ්‍යස්ථවාදය නිර්ණායකයක් ලෙස යෙදීමට පෙර යමෙක් අන්තවාදයන් මොනවාද මධ්‍යස්ථවාදය කුමක්දැයි නිශ්චිතව පෙන්වාදිය යුතුය . එසේ නැතිව අනුන්ට මධ්‍යස්ථවීමට ආරාධනා කිරීම තේරුමක් නැති වැඩකි . එවැනි අවස්ථාවලදී වුවත් වෙනත් කිසිදු හේතුවක් නැතිවම පිළිගනු ලැබීමට මධ්‍යස්ථවාදයකට ඇති සුදුසුකම කුමක්දැයි ඇසිය හැකියි . මෙහිදී අප සංගත බව නිර්ණායකයක් කරගන්නේ මන්දැයි කෙනෙකුට ඇසිය හැකිය . එයට කෙටි පිළිතුර මිනිසුන් ලෝකය (සහ දැනුම) නිර්මාණය කරගෙන ඇත්තේ සංගත ගුණයත් සමග බවය .

අනෙක් අතට අවශ්‍ය තැනදී අපි අන්ත දෙකකට වැඩි තත්වයන් ගැනද සලකා බලමු . චතුස්කෝටික න්‍යායක් භාවිතා කරන අපට ඇරිස්ටෝටල් පඬිවරයාට මෙන් හැමවිටම "අන්තවාදී " වීමට සිදුවන්නේද නැත . ඇරිස්ටෝටල් පඬිතුමා නම් කිසිම මධ්‍යස්ථයකට ඉඩ නොතැබීය. ඒ ඔහුගේ මධ්‍යය බැහැර කරන නීතියේ (law of excluded middle) එන්නකි. මෙරට මධ්‍යස්ථවාදීන්ට අනුව බැලුවොත් ඇරිස්ටෝටල්ද අන්තවාදී නීතිකාරයෙක් වෙයි . රූපික ද්වීකෝටික න්‍යාය ද අන්තවාදයකැයි බැහැර කළ හැකි වෙයි . කෙසේ වෙතත් ඇරිස්ටෝටල්ට හෝ ඇරිස්ටෝටල්ගේ න්‍යාය සත්‍යයැයි පිළිගන්නවුන්ට අන්තවාදී ලේබලය ගැසීමට කිසිවෙකුත් ඉදිරිපත් වී දැයි දැනගන්නට නැත .

- දසුන් තාරක